# ‘පට්ඨානදේශනා මාලාව’ 29 වෙනි දේශනාව (මාර්ග ප්‍රත්‍යය)

## 2017-09 -21

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජාණන්වහන්සේට බුදුරාජාණන් වහන්සේ විසින් පාරමී ධර්ම ගමනේදී පිරුවා වූ දස පාරමී ධර්මයන්ගේ අනුහසින් බලයෙන් අත්පත්කොට ගත්තාවූ සර්වඥතාඥාන සම්පත්තියට සර්වඥතාඥාන සම්පත්තියට බැඳී පවතින්නා වූ අනන්ත අපරිමාණ බුද්ධ ගුණයන්ට බුද්ධ ඥානයන්ට සීල සමාධි ප්‍රඥා ගුණයන්ට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ නුවණින් දැක්කා වූ නුවණින් දැක ලෝකයාට දේශනා කොට වදාළා වූ සුමධුර වූ මිහිරි වූ මනෝහර වූ ප්‍රණීත වූ සත්වයන්ගේ කෙලෙස් ගිනි නිවා ලන්නා වූ සත්වයන්ට නිර්වාණ සැපත ලංකර දෙන්නා වූ ධර්ම ස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ධර්ම මාර්ගයේ ගමන්කොට සීලයෙන් පෝෂණය වී සමාධියෙන් පෝෂණය වී වැඩී ප්‍රඥාවෙන් ප්‍රනීත ලෙස පෝෂණය වි වැඩී කෙලෙස් නසාගෙන නිවනට පත් උනාවූ ආර්ය භාවයට පත් උනාවූ ශ්‍රාවක භූමියේ පිහිටියා වූ අශ්ඨාර්යපුග්ගල සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ධර්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ වූ ගුණානුභාව බලයෙන් සහ මේ මොහොතේදී තුනුරුවන් ගුණ මොහොතකට හෝ මෙනෙහි කොට වන්දනා කිරීමේ කුසල චේතනාවන්ගේ අනුභාව බලයෙන් සහ මේ පින්වතුන් සිදුකර ගත්තා වූ සියලුම කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ මොහොතේ ඉදිරිපත් කරගෙන තිබෙන්නා වූ මාතෘකාව යටතේ කියලා දෙන ධර්මය හොඳින් වටහා ගන්න සැම දෙනාටම සිහිය නුවණ වැඩේවා! යෝනිසෝමනසිකාරය පවත්වා ගන්න හැකි වේවා! කෙලෙසුන්ගෙන් බාධකයක් නොම වේවා! නීවරණ ධර්මයන්ගෙන් බාධකයක් නොම වේවා! ශ්‍රද්ධාව ආදී ගුණ ධර්ම සන්තානයේ වැඩේවා! බෝධි අංග ධර්ම වැඩේවා! මේ කියන ධර්ම හොඳට වටහාගෙන තේරුම් අරගෙන සැම දෙනාටම උතුම් අමාමහ නිවනින් නිවී සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ආශිර්වාද කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් තමයි මේ පින්වතුන්ට මේ වෙලාවේදී මේ කරුණු ටික කියන්නේ.

මීට පෙර අවස්ථාවකදී අපි කථා කළා ප්‍රත්‍යය ධර්ම පිළිබඳව. ඉතින් අදත් අපි ඉදිරිපත් කරගත්තා ප්‍රත්‍යය ධර්මයක් පිළිබඳව මේ පින්වතුන්ට කියන්න. අද මේ කථා කරන්න යන්නේ **‘මාර්ග ප්‍රත්‍යය’** පිළිබඳවයි. ‘මාර්ග’ කියන ප්‍රත්‍යය ඉතාමත් විශේෂයි. අපි සැම දෙනාටම විශේෂ කාරණයක් ඒක. සූත්‍ර දේශනාවලත් බුදුරාජාණන්වහන්සේ මාර්ග

පිළිබඳව දේශනා කරලා තිබෙනවා ලෝකයේ තිබෙන්නා වූ මාතෘකා වචන වලට ගලපලා. මේ මාර්ගය කියලා කියන එක ගැන හැඳින්වීමක් කරනවා, විස්තර කරලා තිබෙන පාලි පොත්වල. ඒ කියන්නේ සුගතියටත් දුගතියටත් නිර්වාණයටත් ගමන් කරන නිසා, සුගතියට දුගතියට නිර්වාණයට පමුණුවන නිසා යම් කිසි ධර්ම කොට්ඨාශයකට කියනවා මාර්ග කියලා. ඇත්ත වශයෙන්ම මාර්ගය කියන එක පුද්ගලයෙක් යන එකක් නොවෙයි. පුද්ගලයෙක් නිවනට යනවා කියලා නෑ. අපි මේ ලෝක සම්මුතියෙන් කථා කළාට පුද්ගලයෝ නිවන් දකින්නේ නෑ. පුද්ගලයෝ නිවනට යන්නේ නෑ. පුද්ගලයෝ සංසාර දුකෙන් මිදෙන්නෙත් නෑ. එහෙම කථාවල් ඉදිරිපත් වෙන්නේ සූත්‍ර ආශ්‍රයෙන්. සූත්‍ර දේශනාවට අනුව බණ අහන අය ඉන්නවා. සිල් රකින අය ඉන්නවා. සාමාධිය වඩන පුද්ගලයෝ ඉන්නවා. ප්‍රඥාව වඩන පුද්ගලයෝ ඉන්නවා. ඉතිරියක් නැතුව මේ කියලා දෙන්නා වූ ධර්ම කාණ්ඩයට ගියහම අභිධර්ම කථාවේ පුද්ගල මාතෘකා පුද්ගල දේවල් නෑ. ඒවා ධර්ම සමූහ පමණයි. ඒක නිසා අපි කථා කරන්නා වූ මේ ධර්ම ගොඩේ පුද්ගලයෙක් නැති හිත් ගැන කථා කරන්නේ. පුද්ගලයෙක් ගැන කියන්නේ නැති චෛතසික ධර්ම ගැන කථා කරන්නේ. පුද්ගලයෙක් නැති රූප ධර්ම පිළිබඳව කථා කරන්නේ. පුද්ගලයෙක් නොවෙන නිර්වාණ ධාතුවක් ගැන අපි කථා කරන්නේ.

මේ පුද්ගලයෙක් නොවන්නා වූ ධර්ම සමුදාය තුල නිර්වාණ ධාතුව පැත්තට ගමන් කරවන ඒ පැත්තට ගෙන යන ධර්ම තිබෙනවා. ලෞකික වශයෙන් දිව්‍යලෝක පැත්තට ගෙන යන ධර්ම තිබෙනවා. ලෞකික වශයෙන් අපාය ආදී ස්ථානවලට පමුණුවන ධර්ම තිබෙනවා. මේවා තමයි 'මාර්ග හැටියට' 'ගෙනියන ධර්ම' හැටියට කථා කරන්නේ.

එක වේලාවක කල්පනා කරමින් ඉන්නකොට plane එකක් මෙච්චර බර පටවාගෙන මිනිස්සු ටිකක් නග්ගාගෙන බඩු බාහිර අදිය දරාගෙන ටොන් ගානක් ඔසවාගෙන මේ අහසේ යන්නේ කොහොමද කියලා බැලුවහම අපිට මේ විදියට තේරුම් ගන්න පුළුවන්. මේ පින්වතුනුත් හිතලා ඇති. ගුවන් යානයක තිබෙනවා propeller දෙකක්. Propeller හතරේ ඒවත් තිබෙනවා දෙකේ ඒවත් තිබෙනවා. බලන්න ඒකෙන් කරන දේ. ඒ propeller එකෙන් හුළං ඇද ගන්නවා. ඒ ඇද ගන්න හුළඟ සීතලයි. අහසේ තිබෙන්නා වූ පිරිසිදු වායුව absorb කරගන්නවා. ඒකට suck කරගන්නවා. එහෙම පිරිසිදු වායුව ගන්න ගමන් plane ඒකේ පිටිපස්සෙන් රත් වෙච්ච වායුව දැවිච්ච වායුව එළියට දානවා. සිසිලස ගන්නවා. රත් වෙච්ච දේවල් බැහැර කරන කරනකොට ඒ බැහැර කිරීමත් එක්ක plane එක ඉස්සරහට තල්ලු වෙලා යනවා. ඒක තමයි එතැනදි සිද්ධ වෙන්නේ. මේක අපේ හිතට දැම්මහම ඔය වගේ දෙයක් තමයි අපේ මනසේ සිද්ධ වෙන්නේ.

සිසිල් ධර්මය අපි අපේ හිතට ගන්නවා. අපේ හිත ශාන්ත කරන අපේ හිත සිසිල් කරන අපේ හිත සන්සුන් කරන ධර්ම අපේ ජීවිතියට එකතු කරගන්නවා. සීලය වශයෙන් අපි ගන්නවා ධර්ම, සමාධිය වශයෙන් අපි ජීවිතියට එක්කාසු කරගන්නවා ධර්ම, ප්‍රඥා වශයෙන් අපි ජීවිතියට එක්කාසු කරගන්නවා ධර්ම. අර plane එක පිරිසිදු වායුව ළං කරගන්නවා වගේ අපි හැම පැත්තෙම තිබෙන හොඳ දේවල් අපේ ජීවිතියට එක්කාසු කරගන්නවා. ඒවාගේම තමයි plane එක රත් වෙච්ච ගිනියම් වෙච්ච වායුව පිට කරන්නේ යම් සේද ඒවගේ අපේ

මේ හිත් දවන අපේ මේ හිත් තවන පුච්චන කකාරවන කෙලෙස් අපි තුරන් කරනවා අයින් කරනවා. ඉවත් කරනවා. එතකොට අපි ඉස්සරහට යනවා. අපිට යන්න ඕන තැනට අපි යනවා. ගමන් කිරීමක් සිද්ධ වෙනවා. ඇත්ත වශයෙන්ම plane එකට ඇද ගන්න හුළඟ පුද්ගලයෙක් නොවෙයි. ඒක දෙවි කෙනෙකුත් නොවෙයි. ඒ හුළඟ බ්‍රහ්මයෙකුත් නොවෙයි. ඒක වායෝ ධාතුව. ඒ වායෝ ධාතුවට පුද්ගල සම්බන්ධයක් නෑ. ඉවත් වෙලා යන වායුවටත් පුද්ගල සම්බන්ධයක් නෑ. ඒක තමයි ඒකෙ හැටි. ඒවගේම තමයි මේ ධර්ම සමුදායක් තිබෙනවා අපේ ජීවිතියට එක්කාසු කරගන්න. ඒ ධර්ම සමුදාය එක්කාසු කරගත්තයින් පස්සේ ඒ ධර්ම ශක්තියේ තිබෙනවා හැකියාවක් ඕන බරක් ඉස්සරහට අරගෙන ඇදගෙන යන්න.

සමහර සත්වයෝ ඉන්නවා හරි ලොකුයි. බල පුළුවන් කාරකම් ගොඩක් තිබෙනවා. රටක් රාජ්‍යක් පාලනය කරන අය ඉන්නවා. දිව්‍යලෝකයේ මහත් ශරීර තිබෙන අය ඉන්නවා. ගොඩක් කල් ජීවත් වෙච්ච අය ඉන්නවා. මනුස්ස ලෝකෙත් එහෙමයි. සක්විති රජවරු, ධනවත් අය, ඉඩකඩම් ආදිය හොඳට පිරෙන්න තිබ්ච්ච අය, සල්ලි මිල මුදල් හොඳට තිබ්ච්ච අය වගේම ගමේ ගොඩේ ඉන්නා වූ අසරණ අයත් මේකේ ගෙනියන්න පුළුවන් ශක්තියක් මේ ධර්ම වල තිබෙනවා, උපමාවක් හැටියට ගත්තොත්.

අද මේ කථා කරන්නේ එහෙම යන්න පුළුවන් ධර්ම කොට්ඨාශයක් පිළිබඳව. ඒකට කියනවා නිවන් පැත්තට යන ගමනටත් දුගතියට යන්නාවූ ඒ ගමනටත් උපකාර වෙන උදව් වෙන ධර්ම සම්භාරයක්. අපි බැලුවොත් එහෙම පෘථක්ජන සත්වයාගේ සිත පුදුමයි. වෙනස් වෙනවා. එක එක අවස්ථාවලදී ක්‍රියාවන් සිද්ධ කරනකොට කුසලය ඉස්සරහට තියාගෙන කුසලය පැත්තට කටයුතු සිද්ධ වෙනවා. අපි හිතමු කෙනෙක් හොඳ දෙයක් කරන්න යනකොට ඒ හොඳ ක්‍රියාව පැත්තට හැරිලා ඒ පැත්තට නැමිලා පෘතක්ජන භාවයෙන් මිදිලා .(..not clear....). එහෙම වෙන්න හේතුව නිර්වාණයට ගෙනියන්නා වූ ගති ස්වභාවයක් මේ හිතේ තිබෙන නිසා. එතකොට මේ සිත කුසල කර්ම වශයෙනුත් මේ සිත අකුසල කර්ම වශයෙනුත් ඒ ඒ පැත්තට ඒ ඒ දිසාවන්ට අරගෙන යන ගතියක් තිබෙනවා. මේ ගතිය පිටින් අදින ගතියක් නොවෙයි, මේ හිත ඇතුලෙම මේ චිත්ත චෛතසික අස්සෙම ඒවාට කැවිලා ඒවාට බැඳිලා තිබෙනවා. ඒ නිසා මේ එක එක පැත්තට අරගෙන යන දිව්‍යලෝක පැත්තට අරගෙන යන බ්‍රහ්මලෝක පැත්තට අරගෙන යන ධර්ම ශක්ති වගේම ප්‍රේත ලෝකයට තිරිසන් ලෝකයට නරකයට දුගතියට අරගෙන යන ධර්ම ශක්ති මේ හිතේ බැඳිලා තිබෙනවා. නිර්වාණයට යන්නා වූ ධර්ම ශක්තිත් මේකේ තිබෙනවා. ආන්න ඒ ධර්ම ශක්ති ඒ ධර්ම ගුණ ඒ උපකාරක ධර්ම පිළිබඳව කථා කිරීමයි අද මේ කරන්නේ. ඒවාට කියනවා **මාර්ග ධර්ම** කියලා.

ඇත්තටම අපි හිතාගෙන ඉන්නේ මාර්ගය කියන එක highway එකක්, පාරක් වගේ කියලා. මාර්ගය කියන එක අපේ හිත බාර අරගෙන තිබෙන්නේ ඔයවගේ පින්තූරයකින්. මාර්ගයක් කියපු ගමන්ම අපිට වැටහෙන්නේම මේ පොළොවේ තිබෙන්නා වූ පාරක්. ලොකු හෝ පොඩි දිග හෝ කොට වශයෙන්. ගෙදරට යනපාර ටවුමට යන පාර ගමට යනපාර කියලා තමයි අපි කථා කරන්නේ. එතකොට මාර්ගය කියලා අපිට වැටහෙන්නේ ඔන්න

ඕක. හැබැයි අපි එයින් බැහැර වෙලා ගියැන් පස්සේ අපි 'දියුණු වෙන්න යන මාර්ගය' 'ආදායම් මාර්ගය' කියලත් කියනවා. ඒක එතකොට යම්කිසි ක්‍රියා පටිපාටියක්. අදායම් මාර්ගයක්. යම් කිසි දියුණුවෙන මාර්ගයක්. ඒවාගේම කීර්තියක් ප්‍රශංසාවක් ලබාගන්න උපකාරවෙන මාර්ගයක්. විදේශ ගතවෙන මාර්ගයක්. ඒවා පොළොවේ තිබෙන දේවල් නොවෙයි, හිතට සම්බන්ධ දේවල්. අද කථා කරන්නෙත් ආන්න ඒ වගේ ධර්ම.

මෙතැන තිබෙනවා ධර්ම කීපයක්. එකක් තමයි අපේ හිතේ තිබෙන **සම්මා දිට්ඨිය** කියන ධර්ම ස්වභාවය. ඒක **ප්‍රඥා චෛතසිකය**. මේ ප්‍රඥා චෛතසිකයට හොඳට දකින්න පුළුවන්. ඒකට හොඳට පේනවා. දකින්න පුළුවන් ගුණය බලන්න පුළුවන් ගුණය නිවැරදිව පේන ගතිය ප්‍රඥා චෛතසිකයට තිබෙන හින්ද ඒකට වෙන නමකුත් කියනවා. ඒක නිසාම කියනවා **සම්මා දිට්ඨිය** කියලා. දෙක, **සම්මා සංකල්පය.** තුන, **සම්මා වාචාව**. හතර, **සම්මා කම්මන්තය**. පහ, **සම්මා ආජීවය**. හය, **සම්මා වායාමය**. හත, **සම්මා සතිය**. අට, **සම්මා සමාධිය**. මේ විදියට තිබෙනවා හොඳ පැත්තට අරගෙන යන මාර්ග අංග 8ක්. අපි මේක නිතරම කියනවා. පාඩම් කරගෙන තිබෙනවා.

ඇයි මේවාට මාර්ග අංග කියලා කියන්න හේතුව? ඇයි මේවාට මෙහෙම කිව්වේ? හේතුව, මේ අට දෙනා එකතුවෙලා මේ කෙලෙස් බරිත පුද්ගලයාගේ හිතේ තිබෙන කෙලෙස් බර සැහැල්ලු කරලා සංසාර පුරුදු ආශ්‍රව ඕඝ ධර්ම මේවා ඔක්කෝම unload කර කර සැහැල්ලු කරමින් මේ පුද්ගලයා සම්පූර්ණ නිදහස් කෙනෙක් හැටියට අරෙගන යනවා. ආන්න ඒ ගතිය මේ ධර්ම 8 ට තිබෙනවා. මේ හොඳ පැත්ත, කුසල් පැත්ත. කුසල් වඩනකොට සම්මා දිට්ඨිය පෙරටු වෙනවා. සම්මා සංකල්පය ඉදිරිපත් වෙනවා. සීල වශයෙන් අපි කථා කරනවා 'වාචා' 'කම්මන්ත' 'ආජීව' කියලා, ඒවා ඉදිරිපත්වෙනවා. මේ හැම එකක්ම ගමන් ශක්තිය තිබෙන plane එකට ඕන බරක් අරගෙන යන්න පුළුවන් වගේ ඒ propeller එක කරන්නා වූ වැඩය වගේ මේවා කරකැව්වොත් අපේ හිත්වල වැඩ කරන්න පුළුවන්. අපි හිතමු මේවා wheel අටක් කියලා. මේවා ක්‍රියාත්මක කිරීම් වශයෙන් අපේ හිතේ දාලා කරකැව්වොත් මේවා ක්‍රියාත්මක කෙරෙව්වොත් මේ ධර්ම අපිව අරගෙන යන පැති තිබෙනවා. මේ ධර්ම වඩපු නිසා තමයි අපේ මේ මනුස්ස ලෝකයේ සමහර අය ලෞකික වශයෙන් යානයක් වාහනයක් තියාගෙන ගෙයක් දොරක් හදාගෙන අනිත් අයට වඩා අඩු කරදර ස්වභාවයකින් ජීවත් වෙන්නේ.

දිව්‍යලෝකයේ ශක්‍ර සම්පත් තිබෙනවා. ඒවාගේම දිව්‍ය සම්පත් තිබෙනවා. ඒ තත්වවලට පත් කරලා තිබෙන්නේ වෙන මොකක්වත් නොවෙයි, ඔන්න ඔය ධර්ම ටික. මනුශ්‍ය ලෝකයේ තිබෙනවා සම්පත්තියක් චක්‍රවර්ති සම්පත්තිය කියලා. අද කාලයේ චක්‍රවර්ති රජ කෙනෙක් හොයා ගන්න බැරි උනාට දීර්ඝායුෂ තිබෙන කාලවල සක්විති රජවරු ඉඳලා තිබෙනවා. ඒ තත්වවලට පත් කරන්නෙත් මහා අනුභාව සම්පන්න දේවල් වලට පත් කරන්නේ මේ ධර්ම. බ්‍රහ්ම සම්පත්වලට පත් කරන්නෙත් මේ ධර්ම. මේ ධර්ම ලෞකික වශයෙන් ගෙනියන තැන් තිබෙනවා. කාමාවචර වශයෙන් ස්ථාන හතක් තිබෙනවා. ඒවාගේම බ්‍රහ්මලෝක රූපාවචර සහ අරූපාවචර වශයෙන් තිබෙනවා. මේ සියලුම තැන් ලෞකික වශයෙන් අපිව අරගෙන යන තැන්.

තවත් ධර්මතා හතරක් තිබෙනවා. ඒවා **මිත්‍යා ධර්ම**. ඒවාට කියනවා **මිත්‍යා දිට්ඨිය, මිත්‍යා සංකල්පය, මිත්‍යා වායාමය සහ මිත්‍යා සමාධිය** කියලා. මේ ධර්ම 4 වෙනස් විදියකට තමයි කටයුතු කරන්නේ. ඒක නිසා මේ කියන්නා වූ ධර්මතා 12 ට ගෙන යෑමේ හැකියාව තිබෙන නිසා මාර්ග ශක්තිය තිබෙන නිසා පමුණුවන ගතිය මේවාගේ තිබෙන නිසා මේවාට මාර්ග කියලා කියනවා.

**මිත්‍යා දිට්ඨිය, මිත්‍යා සංකල්පය, මිත්‍යා වායාමය සහ මිත්‍යා සමාධිය** කියන හතර ඉදිරි පත් වෙලා කරන්නේ මේ සත්වයාව නරක තැන් වලට අරගෙන යනවා. මිත්‍යා දිට්ඨිය, මිත්‍යා සංකල්පය, මිත්‍යා වායාමය සහ මිත්‍යා සමාධිය කියන ධර්ම වලට උපකාර වන තවත් ධර්ම අකුසල සිත්වල තිබෙනවා. මේවා නිසා යන්නේ දුගති ස්ථාන වලට. ඒවාගේම තව උපාය කියලා වචනයකුත් මේවාට පාවිච්චි කරනවා. එතකොට අර මුලින් කියපු **සම්මා දිට්ඨිය, සම්මා සංකල්පය, සම්මා වාචාව, සම්මා කම්මන්තය, සම්මා ආජීවය, සම්මා වායාමය, සම්මා සතිය, සම්මා සමාධිය කියන** අටෙන් හොඳ පැත්තට අරගෙන යනවා. අනිත් එක තමයි නිර්වාණයට යන්නත් මේ කියපු ධර්මතා අට තමයි තිබෙන්නේ. නරකට තිබෙන දේවල් වලින් නරකය පැත්තට අරගෙන යනවා. නමුත් ලෝකයේ කථා කරනකොට මේවා ධර්මතා හැටියට නොවෙයි කථා කරන්නේ, ක්‍රියා හැටියටයි කථා කරන්නේ. මේවා මානසික ධර්ම. නමුත් මේවා අපි ලෝකයේ මානසික ධර්ම හැටියට කථා කරන්නේ නෑ. කවුරු හරි වැරදි කථාවක් කරපු ගමන්ම අපි කියන්නේ 'බලන්න ඒ කියපු වචනය කොච්චර අපිරිසිදු ද කොච්චර අසෝභනද කොච්චර අකුසල් ද කොච්චර නරකද' කියලා අපි කථා කරන්නේ. නමුත් ඒ වචනය ක්‍රියාත්මක වෙච්ච හිතක් තිබෙනවා. මෙතැන කථා කරන්නේ ඒ හිතයි. ක්‍රියාවත් එහෙමයි. ලෝකයේ අපි කථා කරන්නේ 'බලන්න එයා කළවැඩේ කොච්චර නරකද' කියලා. හොඳ වැඩක්නම් 'කොච්චර හොඳද ඒ වැඩේ' කියලා කියනවා. නමුත් මෙතැන කථා කරන්නේ කායික සම්බන්ධය තිබුණාට කය operate කරන්නා වූ මානසික ධර්ම ගුණයයි. එතකොට මේ විදියට ධර්මතා තිබෙනවා 12ක්. ඔය 12 හ තමයි මාර්ග ශක්තිය තිබෙන මාර්ග ධර්ම හැටියට මේ කොටසේදී කථා කරන්නේ සහ කියලා දෙන්නේ.

Plane එකක් යනකොට plane එකටම සම්බන්ධ වෙච්ච කොටසක් තමයි propeller එක, ඒකෙන් පරිබාහිර වෙච්ච එකක් නොවෙයි. ඒ කොටස ඒ plane එකටම ඇදිච්ච දෙයක්. ඒකෙන් තමයි ඔය ඔක්කොම ටික ඉස්සරහට අරගෙන යන්නේ. අපේ ජීවිතියේ හිතට සම්බන්ධ දෙයක් තමයි මේ. ඒ නිසා මේ මාර්ග ධර්ම තමයි අපිව සසර දුකෙන් මුදවලා නිර්වාණයට යවන්නෙත් වරදවා ගත්තොත් අපායට යවන්නෙත් හොඳ කරගත්තොත් සුගතියට යවන්නෙත්. දැන් මේකේ තිබෙන්නා වූ එක එක ධර්මයක් අපි අරගෙන බලමු.

සම්මා දිට්ඨිය කියලා කියන්නේ ප්‍රඥා චෛතසිකය. සම්මා සංකල්පය කියලා කියන්නේ විතර්කය. සම්මා වාචා කියලා කියන්නේ විරති වල එක චෛතසිකයක්. සම්මා කම්මන්ත කියලා කියන්නෙත් විරති චෛතසිකයක්. සම්මා ආජීව කියලා කියන්නෙත් විරති චෛතසිකයක්. දැන් තිබෙනවා ඔක්කොම ධර්ම පහක්. සම්මා වායාමය කියලා කියන්නේ සම්මා දිට්ඨියත් එක්ක මිශ්‍ර වෙච්ච විරිය චෛතසිකය. සම්මා සතිය කියලා

කියන්නේ සති චෛතසිකය. සති චෛතසිකය සම්මා දිට්ඨියත් එක්ක මිශ්‍ර වෙච්ච ගමන්ම ඒක සම්මා සතිය වෙනවා. සමමා සමාධිය කියලා කියන්නේ ඒකාග්‍රතා චෛතසිකය. දැන් ඔක්කොම චෛතසික ධර්ම 8 ක් තිබෙනවා. දැන් මේ අටම තිබෙන්නේ හොඳ පැත්තට.

නමුත් බලාගෙන ගියහම අනිත් පැත්තෙත් ඕක කියනවා. මිත්‍යා දිට්ඨි කියලා කියනවා. මිත්‍යා සංකල්පය කියලා කියන්නෙත් විතර්ක චෛතසිකය. ඉස්සෙල්ලත් කියලා තිබෙනවා විතර්කය. මේක චෛතසික වශයෙන් එකයි නමුත් අනිත් ඒවගේ බලපෑම නිසා තමයි 'සම්මා' වෙන්නේ හෝ 'මිත්‍යා' වෙන්නේ. මිත්‍යා වායාම කියලා කිච්චා. එතකොටත් ඒ විරිය චෛතසිකම තමයි. යම්කිසි අවස්ථාවකදී විරිය චෛතසිකය 'සම්මා' කියලා කියන්න පුළුවන්කම තිබෙන්නේ අනිත් අයගේ බලපෑම නිසා. මිත්‍යා කියන්න පුළුවන්කම තිබෙනෙත් අනිත් අයගේ බලපෑම නිසා. වායාමය කියන එක අකුසල තැනට යනකොට මිත්‍යාවායාම වෙනවා. ඒකාග්‍රතා චෛතසිකය මිත්‍යා සමාධි වෙනවා. හැබැයි මූලික වශයෙන් ගත්තහම චෛතසික ධර්ම 9යි. ඒ ඉස්සෙල්ලා කියපු චෛතසික ටිකයි දිට්ඨි චෛතසිකයයි. දිට්ඨි චෛතසිකයේ ස්වභාවය තමයි ප්‍රඥාව වගේ හැඩක් පෙන්නනවා. ඥානය වගේ හැඩක් පෙන්නවා. නමුත් ඥානය නෑ. ප්‍රඥාව නෑ. ඔන්න ඔහොම එකක් තිබෙනවා දෘෂ්ඨි චෛතසිකයේ. ගොඩක් අය වරද්ද ගන්නවා ඔතැන. සමහර වෙලාවට මිනුස්සුන්ගේ දෘෂ්ඨි ඥානවන්ත ස්වාභාවයක් හැටියට පිලිගන්නවා. දැන් මේ කියන්නාවූ ධර්මතාවයන් නමය තමයි මූලික වශයෙන් මාර්ග හැටියට කථා කරන්නේ. හොඳටම පමුණුවන ගතිය තිබෙන්නේ මෙම චෛතසික වල.

සූත්‍ර ධර්ම වල මිත්‍යා වාචා තිබෙනවා. විරිය මිත්‍යා කම්මන්තය වශයෙන් යෙදෙනවා. මිත්‍යා ආජීවය කියලා එකක් තිබෙනවා. මිත්‍යා සතිය තිබෙනවා. මේවත් ඇත්ත වශයෙන්ම සූත්‍ර දේශනාවල ලොකුවට කියලා තිබුනත් සිත් වලට මුල් තැන දීලා කථා කළාට, ඇත්ත වශයෙන්ම මිත්‍යා කම්මන්තය කියලා සිතක් හැටියට ගත්තට, මිත්‍යා කම්මන්තය කියලා චෛතසික ධර්මයක් යොදලා නෑ. මිත්‍යා ආජීව කියල ධර්මයක් තිබෙනවා, මිත්‍යා සති කියලා ධර්මයක් තිබෙනවා සිත් මුල් කරගෙන නමුත් මිත්‍යා ආජීවය කියලා මිත්‍යා සතිය කියලා විශේෂිත චෛතසික නෑ. මිත්‍යා සතිය එන්නෙම අකුසල පැත්තේ. සතිය නැති එකම තමයි මිත්‍යා සතිය කියලා කියන්නේ. ඒක නිසා තමයි අතන චෛතසික නමයක් ගොනුකරලා ගන්නේ. මේ ගැන කථා කරනකොට තව එකක් කියන්න තිබෙනවා.

එක සිතක් අරගත්තොත් ඒ සිතක ක්‍රියාත්මක වෙන්නා වූ පමුණුවන්නා වූ ධර්ම බලවේගයක් මේක. මතක ඇති අපේ පින්වතුන් සියලුදෙනාම එකතුවෙලා තික මාතිකාව කථා කළා. තික මාතිකාව කියලා කියන්නේ කුසල ධර්ම ගොඩවල් තුනකට බෙදාගෙන කියලා දෙන්නාවූ ධම්ම සංඝණියේ මාතෘකා පාලියේ මුල් කොටස. ඒක ආරම්භ කරන්නෙම මෙහෙමයි.

'කුසලා ධම්මා' 'අකුසලා ධම්මා' 'අබ්‍යාකතා ධම්මා' ඊළඟට 'සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා' ' දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා' 'අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා

ධම්මා’ කියලා තික මාතිකාවේ තිබෙනවා මාතෘකා 22 ක්. මේකේ පළවෙනි එක තමයි ‘කුසලා ධම්මා’ ‘අකුසලා ධම්මා’ ‘අබ්‍යාකතා ධම්මා’ කියලා කියන්නේ. කුසල ධර්ම හැටියට අකුසල ධර්ම හැටියට අව්‍යාකෘත ධර්ම හැටියට සලකන්න වෙනවා මේ ධර්ම. දැන් මේ කොටස් තුනට දාලා බැලුවහම මේ මාර්ග අංග නමය එහෙම නැත්නම් අනිත් ක්‍රමයට කිව්වොත් මාර්ග අංග දොළහෙන් කුසල වෙන්නා වූ මාර්ග අංග තිබෙනවා ඒවාගේම අකුසල වෙන්නා වූ මාර්ග අංග තිබෙනවා ඒවාගේම මේකේ අව්‍යාකෘත ගතියකුත් තිබෙනවා. එතකොට ගොඩවල් හැටියට ගත්තහම ගොඩවල් තුනක් වෙනවා. අපි මේකෙන් අකුසල මාර්ග අංග හැටියට කියන කීපයක් තිබුණා. අපි ඉස්සෙල්ලාම අකුසල් සිත්12 ක් ගැන කිව්වා. බැලුවහම අකුසල් සිත් 12 හෙ තිබෙනවා **සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික** කියන්නාවූ ලෝභ සිතක්. මේ හිතේ තිබෙන්නේ අකුසල් චෛතසික රාශියක්. ඒකෙ තිබෙනවා දිට්ඨි චෛතසිකය. මේ දිට්ඨි චෛතසිකය ඉස්සරහට ආපු ගමන් ඒ දිට්ඨියත් එක්ක තිබෙන ලෝභය, විතර්ක චෛතසිකය වීර්ය චෛතසිකය කියන ඒවා ඔක්කෝම අර දෘෂ්ඨියට යටකරගන්නවා. සංකල්පයත් මිත්‍යා වෙනවා. ඊට පස්සේ තිබෙන වීර්යත් මිත්‍යා වෙනවා. ඒවාගේම තිබෙන්නා වූ ඒකාග්‍රතා චෛතසිකයත් මිත්‍යා වෙනවා. ඔක්කොම මිත්‍යා වෙනවා. ඒ ධර්මතා 4 මේ එක හිතක් වෙන ලෝභ සහගත හිතේ පැලපදියන් උනහම ඒ ටිකට පුළුවන් අර මාර්ග වැඩේ හෙවත් පමුණුවන වැඩේ කරන්න. ඒ කියන්නේ එවැනි හිතක් පහළ වෙච්ච කෙනා නරකයට ඒවගේම දුගතියට තිරිසන් ලෝකයට ඇදගෙන යන්නා වූ ශක්තියක් ඒකෙ හැදෙනවා.

එතකොට මේ දෘෂ්ඨි චෛතසිකයයි විතර්ක චෛතසිකයයි විරිය කියන චෛතසිකයයි ඒකාග්‍රතා චෛතසිකයයි කියන මේ හතර අර ලෝභ සහගත සිතේ පහළ වෙලා නිකම් ඉන්නේ නෑ. මේ හතරදෙනාට තිබෙනවා එක පොදියට අනිත් චෛතසික ධර්මයන්ට බලපෑමක් කරලා ඒ අයගේ මාර්ග වැඩේ කරන්න සහ ඒ අය නතුකරගන්න හැකියාවක් බලයක්. හරියට කියනවානම් සමහර අවස්ථා වලදී ලංකාව වගේ රටවල් වල මිනිස්සු කාර්යාලවලට හිගිල්ලා ඒ අය බය කරලා තමන්ගේ ශක්තිය පෙන්නලා කෑ ගහලා බලෙන් තමන්ගේ වැඩේ කරගන්න ගතියක් තිබෙනවා. ආන්න ඒවගේ මේ චෛතසික ධර්ම 4 ට හිත තමන්ගේ පැත්තට නතු කරගෙන තමන්ට ඒ වැඩේ බලපවත්වන්න පුළුවන් හැකියාවක් තිබෙනවා. ඒකනිසා තමයි මේවා මාර්ග අංග හැටියට එහෙම නැත්නම් ගෙන යන ගුණය නැත්නම් උපාය ගතිය තිබෙන්නාවූ ධර්ම හැටියට සඳහන් කරන්නේ. අනිත් එක තමයි සමහර අවස්ථාවලදී අනිත් ධර්මත් තිබෙනවා. වායාමය තිබෙනවා ලෝභයට මිශ්‍ර වෙලා, ඒකාග්‍රතාවය තිබෙනවා ලෝභයට මිශ්‍ර වෙලා, සංකල්පය තිබෙනවා ලෝභයට මිශ්‍රවෙලා. මෙන්න මේ වගේ දේවල් පිහිටිය ගමන් මේ මාර්ග වැඩේ කරනවා.

දෝස සහගත සිතෙත් ඔය වගේ තිබෙනවා. මෝහ සහගත සිතෙත් ඕක තිබෙනවා. කුසල පැත්තට ගියාට පස්සේ ඒ කුසල් සිතේ තිබෙනවා සම්මා දිට්ඨි එනම් ප්‍රඥා චෛතසික වගේ දේවල්. විතර්කය සම්මා සංකල්පය වෙනවා, වචාවත් සම්මා වෙනවා, ක්‍රියාවත් සම්මා වෙනවා හොඳ දේවල් ඉදිරිපත් වෙච්ච නිසා. එතකොට එක කාම සෝහන හිතක

තිබෙනවා ඒ හිත පහළ වෙච්ච එක්කෙනාව යම්කිසි තැනකට පමුණුවන අරගෙන යන ගුණය. ඒ කියන්නේ ඒ හිත සමග අනිත් ඇති වෙච්ච චෛතසික ධර්ම ටික තමන්ගේ පැත්තට ලස්සනට සිනහවෙලා සිනා මුසු මුහුණින් තමන්ව නතුකරගන්න ගතිය ඒකෙ තිබෙනවා. කාම සෝභන සිත් තිබෙනවා අටක්. කාම සෝභන සිත් අටේ පළවෙනි **සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත** අපි පුරුදු විදියට මේකට උපකාර වෙන විදියට ගත්තොත් ඒකෙ තිබෙනවා මෙන්න මෙහෙම ගතියක්.

ඒ හිතේ තිබෙනවා අනිවාර්යෙන්ම පහළ විය යුතු කුසල චෛතසික 19 ක්. තව එකතු වෙනවා ප්‍රඥා චෛතසිකය. එතකොට 20යි. තව තිබෙනවා අන්‍ය සමාන චෛතසික 13 ක්. එතකොට ඔක්කොම චෛතසික 33 ක් වෙනවා. 33 + සිත = 34 . මෙන්න මේ චිත්ත චෛතසික ධර්ම රංචුවේ මේ ධර්ම පොකුරේ මාර්ග වැඩේ කරන්නා වූ පමුණුවන වැඩේ කරන්නා වූ ප්‍රඥා චෛතසික තිබෙනවා. විතර්ක චෛතසික තිබෙනවා. ඒ ක්‍රියාවේ හැටියට තමයි සම්මා වාචාව හෝ සම්මා කම්මන්ත හෝ ආජීව හෝ වෙන්නේ. දැන් අපි මේ චෛතසික 33 න සලකා බලමු.

‘සම්මා දිට්ඨිය’ හැටියට ‘ප්‍රඥා චෛතසිකය’ තිබෙනවා. ‘සම්මා සංකල්පය’ හැටියට ‘විතර්ක චෛතසිකය’ තිබෙනවා. ‘විරිය චෛතසිකය’ තිබෙනවා ‘සම්මා වායාමය’ හැටියට. ඊළඟට ‘සති චෛතසිකය’ තිබෙනවා ‘සම්මා සතිය’ හැටියට. ‘ඒකාග්‍රතා චෛතසික’ තිබෙනවා ‘සම්මා සමාධිය’ හැටියට. දැන් මෙතැන චෛතසික 5 ක් තිබෙනවා. අපි හොඳ දෙයක් හිතින් හිතනකොට ධර්මතා 5 ක් ඇතිවෙනවා. ඒ පහට පුළුවන් සත්වයාව යම්කිසි සුගතියකට පමුණුවන්නා වූ මාර්ග වැඩේ කරන්න. මේ පස් දෙනා අනිත් චෛතසික ධර්ම වලටත් හිතටත් බලපෑම් කරලා ඉස්සරහට අරගෙන යනවා.

අපි හිතමු මනුස්සයෙක් හොඳ වචනයක් කථා කරනවා කියලා හොඳ හිතකින්. එතකොට චෛතසික ධර්ම ඔක්කොම වෙනවා 34ක් සම්මා වාචාවත් එක්ක. එතකොට ‘ප්‍රඥා චෛතසිකය’ තිබෙනවා. ‘විතර්ක චෛතසිකය’ තිබෙනවා. ‘සම්මා වාචා චෛතසිකය’ තිබෙනවා. ‘වීරිය චෛතසිකය’ තිබෙනවා. ‘සති චෛතසිකය’ තිබෙනවා. ‘ඒකාග්‍රතා චෛතසිකය’ තිබෙනවා. මේ පස්දෙනා අනිත් සියලුම දෙනා තමන්ගේ පැත්තට නතුකරගෙන සම්මා වාචාවේ හැටියට හොඳ දෙයක් කීම් හැටියට අනිත් චෛතසික තමන්ගේ පැත්තට බල ගන්වාගෙන යොමුකර ගන්නවා. දැන් එතකොට මේ කියන්නාවූ මාර්ග වැඩේ කරන චෛතසික ධර්ම වල තිබෙනවා අනිත් ධර්ම වලට ප්‍රත්‍යය වෙන අනිත් ධර්ම වලට බල ගන්වන උපකාර වෙන ගතිය. ආන්න ඒ ශක්තිය තිබෙන නිසා මේවාට කියනවා **මාර්ග ප්‍රත්‍යය ධර්ම** කියලා. එතකොට මාර්ග ප්‍රත්‍යය ධර්ම ලබා ගන්නාවූ අනිත් ධර්ම වලට කියනවා **ප්‍රත්‍යය උප්පන්න ධර්ම** කියලා. එතකොට මාර්ග ප්‍රත්‍යය ධර්ම තිබෙනවා, මාර්ග ප්‍රත්‍යය වලින් ප්‍රත්‍යය ලබා දෙනකොට ඒ ප්‍රත්‍යය ගන්න ධර්ම තිබෙනවා. ඒවාට කියනවා **මාර්ග ප්‍රත්‍යය උප්පන්න ධර්ම** කියලා.

ඒවාගේම හිතක් පහළ වෙන අවස්ථාවේදී **අව්‍යාකෘත ධර්ම** සමූහයකුත් තිබෙනවා. ඒ තමයි හිතක් පහළ වෙනකොට ඒකත් එක්ක බැඳී පවතින සහජාතව පහළ වෙන රූප ධර්ම

සමූහය. ඒවාටත් මේ මාර්ග ප්‍රත්‍යය යම්කිසි බලපෑමක් කරනවා. ඔය කුසල් සිත් වල ඔය ගතිය තිබෙනවා. අනිත් ඒවගෙත් ඔය ගතිය තිබෙනවා. නමුත් ඒවා කථා කරන්නේ නෑ මාර්ග ප්‍රත්‍යය ලබා දෙන ඒවා කියලා. උදා: විපාක සිත් වලත් මේ ධර්ම තිබෙනවා, නමුත් ඒවා ඉස්සෙල්ලා කරපු දෙයක බලයක් නිසා මේ වෙලාවේ ඇතිවෙන දෙයක්. ඒකනිසා ඒවගේ තිබෙන්නාවූ වේගය හරිම සූක්ෂම වෙච්ච නමුත් ප්‍රකට නැති ගතියක්. නමුත් අනිත් සිත් වල තිබෙනවා ඇදගෙන යන්නාවූ ගතිය. ඉතින් මේ මාර්ග ධර්ම පිළිබඳව අපි තේරුම් ගත යුතුයි ඔය විදියට. මම හිතනවා මේක මේ පින්වතුන්ට තේරෙන්න ඇති වැටහෙන්න ඇති කියලා. අපි සාකච්ඡා කරන අවස්ථාවේදීත් නැවත ඉස්මතු කරලා ගනිමු. මේ වෙලාවේ මම කිව්වේ ධර්මතා 12ක්. ඒ ධර්මතා 12 මූලිකම ධර්ම ගත්තයින් පස්සේ තිබෙන්නේ 9යි. මම කිව්වා ඒ 9 කුසල පැත්තටයි අකුසල පැත්තටයි යනතාලේ.

ඉතින් අපේ ලොව්තුරා බුදුරාජාණන්වහන්සේ දේශනා කළා මේ ධර්ම හිතේ වැඩෙන ආකාරය, යම් කිසි ක්‍රියාවක් කරනකොට දානමය වශයෙන් හෝ වේවා සීලමය හික්මීම වශයෙන් හෝ වේවා සමාධිය ප්‍රඥාව වැඩීම වශයෙන් හෝ වේවා භාවනා වශයෙන් හෝ වේවා කෙරෙනකොට මැද්දට පැනලා වැඩ කරන්නේ මේවා තමයි. සමහර මිශ්‍රණ තිබෙනවා ආහාර වලට හෝ වෙනත් දේවල්වලට දානකොට සමහර විට එය මෘදු කරනවා. සමහර විටක එය හයිය කරනවා. වතුර කියන්නේ ගලායන දෙයක්. ඒවාගේම සිමෙන්ති වගේ දේවල් පිටි වගේ දේවල් කියන්නේ powder එකක්. ඊළඟට ගල් කැට කියන්නේ වෙන වෙනම තිබෙන දේවල්. දැන් බලන්න වෙනම තිබෙන්නා වූ දේවල් එනම් ගලුයි වැලියි සිමෙන්තියි ඔක්කොම එක්කාසු කරලා වතුර දැම්මට පස්සේ සිමෙන්ති වල තිබෙනවා වතුරත් එක්ක එක්කාසු උනාට පස්සේ අනිත් ඒවත් ඔක්කෝම හයියට අල්ලාගෙන ඉන්න තද කරන ගතිය. ඒ ගතිය පිටින් නොවෙයි තිබෙන්නේ, ඒක තිබෙන්නේ ඒකෙම අස්සේ. ඒවාගේම තමයි සමහර දේවල් වල තිබෙනවා හයියට තිබ්ච්ච දෙයක් බුරුල් කරන්න පුළුවන් ගතිය. ඒක තිබෙන්නේත් ඒක ඇතුලේමයි. ඒවගේම මේ ධර්ම වල තිබෙනවා අනිත් ධර්මත් එක්ක එක්කාසු උනහම ඒවාට බලපෑම් කරලා එක පැත්තකට එක රටාවකට එක දිසාවකට එක අරමුණක් පැත්තකට හරවාගෙන ඇදගෙන යන ගතිය. අන්න ඒ ධර්ම පිළිබඳව දැනීම දැකීම අවබෝධය අපිට තිබෙන්න ඕන. ඒක බුදුරාජාණන් වහන්සේත් අපේ හිත්වල තිබෙන නිසාමයි අපිට නිර්වාණ මාර්ගය දේශනා කළේ. මෙහෙම නිවනක් තිබෙනවා, ධර්මයක් තිබෙනවා. මෙතැනට යන්න පුළුවන්, ඒක නිසා කරන්න ඕනෑ වෙන්නේ මෙන්න මේකයි කියලා. ඒ නිසා අද මේ අපි කථා කරන්නේ ආන්න ඒ ධර්ම ගොනුවක එක්තරා ප්‍රදේශයක්, එක්තරා කොටසක්. අපේ මේ පින්වත් සැමදෙනාටම ඒ ධර්ම හොඳට තේරුම් අරගෙන ඒ ධර්ම හොඳට අවබෝධ කරගෙන වටහාගෙන හැම කෙනාටම මේ ධර්ම විනිවිද දැකලා ඒවායේ තිබෙන තවත් ස්වභාව ධර්ම ලක්ෂණත් හොඳට අවබෝධ කරගෙන ඒවාට අහුවෙන්නේ නැතුව ඒවාට බැඳෙන්නේ නැතුව ඒවා පතන්නේ නැතුව ඒවාගෙන් ඉවත් වෙලා සැම දෙනාටම සංසාර දුකෙන් මිදිලා නිවනින් සැනසෙන්න ලැබේවා! නිවන් අවබෝධය පිණිස මේ ධර්මය මහෝපකාරී වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. හැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

<u>ප්‍රශ්නය</u> - අප්‍රමාණ පිං ගෞරවණීය ස්වාමීන්වහන්ස ඔබවහන්සේට නමස්කාර වේවා! ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අන්තිමට සඳහන් කරපු තැන ප්‍රත්‍යය උප්පන්න ධර්ම වශයෙන් චිත්ත චෛතසික ධර්ම ඇතිවෙනවා. ඒ සිත් සමග ඇතිවෙන රූප කොයි ආකාරයටද මාර්ගය බල පාන්නේ කියලා පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස. අනිත් එක ඔබ වහන්සේ කිව්වා වගේ මතකයි සමහර තැන් වල පමණයි ඒක වෙන්නේ කියලා. ඒකත් පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - එතැනදී මම කිව්වේ ප්‍රත්‍යය උප්පන්න ධර්ම සලකනකොට එක පැත්තකට විතරක් වෙනවා. නැත්නම් මාර්ග ප්‍රත්‍යය ගුණය මාර්ග ප්‍රත්‍ය ශක්තිය රූප වලට නෑ. හිතක් උපදින අවස්ථාවදී ඍජුව නොවෙයි වක්‍රාකාරව ඒකත් එක්ක හිතක් පහළ වෙනකොට හිතට අනුකූලව ඇතිවෙනවා රූප ධර්ම. එහෙම සිද්ධියක් වෙනවා ඇරෙන්න මාර්ග ගුණය රූප වල නෑ. රූප අව්‍යාකෘතයි. ඒ කයි මම කිව්වේ. තෙරුවන් සරණයි!

බොහොම පිං ස්වාමීන්වහන්ස, තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි අප්‍රමාණ පිං අද දේශනයටත්. තේරුම් ගත්ත විදිය හරිද කියලා අහන්නත් එක්ක තමයි ස්වාමීන්වහන්ස මේ ප්‍රශ්නයක් විදියට අහන්නේ. ඔබ වහන්සේ අපිට පැහැදිලි කරලා දුන්නා 'සම්මා දිට්ඨි' 'සම්මා සංකල්ප' 'සම්මා වාචා' 'සම්මා කම්මන්ත' 'සම්මා ආජීව' 'සම්මා වායාම' 'සම්මා සති' 'සම්මා සමාධි' කියන කුසල ධර්ම සුගති ගාමී මාර්ගයකුත් වෙනවා ඒවාගේම නිර්වාණ මාර්ගයකුත් වෙනවා. ඒවගේම ඒකට විරුද්ධව මිත්‍යා දිට්ඨියෙන් පටන්ගෙන මිත්‍යා සමාධි ලෙස යන ඒ මාර්ගය දුගතියට මාර්ගය වෙනවා කියලා තේරුම් ගත්තා. එතනදී ස්වාමීන්වහන්ස චෛතසික ධර්ම හැටියට තේරුම් ගන්න කොට සම්මා දිට්ඨිය ප්‍රඥාව හැටියට අපි ගත්තා. සම්මා සංකප්පයත් මිත්‍යා සංකප්පයත් කියන දෙකම විතර්ක චෛතසික ලෙස සැලකුවා කියලා හිතෙනවා. ඊළඟට සම්මා වාචා කියන චෛතසික සෝබන චෛතසිකයක් හැටියට තිබෙනවා. සම්මා කම්මන්ත සම්මා ආජීව කියන දෙකත් සෝභන චෛතසික දෙකක්. ඊළඟට සම්මා වායාමයත් මිත්‍යා වායාමයත් යන දෙකම ප්‍රකීර්ණක චෛතසිකයක් වෙන විරිය චෛතසිකය. ඊළඟට සම්මා සතිය වෙන්නේ සති චෛතසිකයයි. මිත්‍යා සතිය කියලා චෛතසිකයක් නැති නිසා අපි ඒක සලකන්නේ නැහැ. අපි සති චෛතසිකය විතරයි සලකන්නේ. ඒක සෝභන චෛතසිකයක්. ඊළඟට සම්මා සමාධි මිත්‍යා සමාධි යන දෙකම ඒකාග්‍රතා චෛතසිකයෙන් නියෝජනය වෙනවා කියලා ගත්තා. එතකොට අපි එතැන චෛතසික ධර්ම 8 කථා කළා. 'ප්‍රඥාව' 'විතර්කය' 'සම්මා වාචා' 'සම්මා කම්මන්ත' 'සම්මා ආජීව' 'විරිය' 'සති' 'ඒකාග්‍රතා' කියන 8. ඊට පස්සේ මිත්‍යා දිට්ඨිය කියන තැනදී 'දිට්ඨිය' ගත්තහම නමයක් වෙනවා කියලයි තේරුණේ. ඒක නිවැරදි ඇති කියලා තේරුණා.

ඊළඟට මේක ප්‍රත්‍යය වෙනවා කියනකොට ස්වාමීන්වහන්ස අහේතුක සිත්වලට මේක අයිති වෙන්නේ නැහැ කියන තේරුමක් තිබුණා. නමුත් ඒ සිත් වලත් විතර්කය යෙදෙනවා.

නමුත් ඒ අහේතුක සිත්වල යෙදෙන විතර්ක චෛතසිකය වගේ දේවල් මේ ප්‍රත්‍යය ධර්ම හැටියට නොගන්නවා කියලා තේරුම් ගත්තොත් හරිද ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - තෙරුවන් සරණයි! මහත්තයා චෛතසික ධර්ම ටික සූත්‍රාන්ත දේශනා වලින් බේරාගෙන චෛතසික ධර්ම පැත්තට හැරිලා ගණනය කර ගත්ත විදිය නිවැරදියි. ඔය විදියට තමයි චෛතසික ධර්ම නමය සකස් වෙන්නේ. ඇත්ත වශයෙන්ම අකුසල පැත්ත නියෝජනය වෙන්නේ එක චෛතසික ධර්මයයි. නමුත් ඒ අකුසල පැත්තෙන් නියෝජනය වෙන එක අකුසල ධර්මය එනම් මිත්‍යා දිට්ඨිය එක්ක ඇඳී තිබෙන්නා වූ වායාම කියන ප්‍රකිර්ණකයත් නරක් වෙනවා එතැනට ගියාට පස්සේ. සංකප්පයත් විතක්කයත් නරක් වෙලා යනවා මිත්‍යා දෘෂ්ඨියේ ගැවුනහම. ඒකග්ගතාවයත් නරක් වෙලා යනවා මිත්‍යා දෘෂ්ඨියේ ගැවුනහම. ඒක නිසා තමයි ඒ හතර මාර්ග ධර්ම හැටියට ගණන් ගන්නේ.

මේකත් එකතු කරගන්නවා නම් හොඳයි, එක තැනක තිබෙනවා ගාථාවක් **'පූතිමච්ඡං කුසග්ගෙන, යො නරො උපනය්හති; කුසාපි පූති වායන්ති, එවං බාලූපසෙවනා'** කියලා. බාලයෝ අසුරුකිරීමේ දී වෙන දෙයක් ගැන මෙතැන තිබෙන්නේ. ඒක මේකට ගැලපිලා යනවා. ඒ කියන්නේ මිත්‍යා දෘෂ්ඨිය කියන්නා වූ පච්කාර අකුසල සහගත වූ චෛතසිකයේ ගැවුනහම විතර්කයත් මිත්‍යා සංකල්පයක් වෙනවා. වායාමය කියන එක මිත්‍යා දෘෂ්ඨියේ ස්පර්ශය ලබපු ගමන් මිත්‍යා වායාමයක් වෙනවා. ඒකාග්‍රතාව කියන්නේ සමාධිය, ඒක මිත්‍යා දෘෂ්ඨියේ ගැවුන ගමන් මිත්‍යා සමාධිය වෙනවා.

**'පූතිමච්ඡං කුසග්ගෙන, යො නරො උපනය්හති** = මනුස්සයෙක් කුණු මාළු ටිකක් කොළයකින් ඔතනවා. කුණු මාළුයි කොළෙයි කියන්නේ වස්තු දෙකක්. කුණු මාළු කොළයකින් එතුවහම .....

**කුසාපි පූති වායන්ති** = .... ඒ ඔතාපු කොළයෙනුත් මාළු ගඳ හගනවලු.

**එවං බාලූපසෙවනා** = ඒ වගේලු බාලයන් ආශ්‍රය කරාට පස්සේ තමන්ට වෙන දේ. ඒ ගැනයි මේකෙන් කියන්නේ.

ඒ වගේ තමයි මේ ප්‍රකීර්ණක චෛතසික කුසලුත් නොවෙයි අකුසලුත් නොවෙයි. ඒ උනාට ඒවා අනිත් ඒවායේ සපර්ශ උනගමන්ම මාළු තැවරෙනවා වගේ වෙනස් වෙනවා.

ඒක නිසා මහත්තයාගේ ගණනය කර ගැනීම නිවැරදියි. ධර්මතා නමයයි තිබෙන්නේ. මේ මාර්ග ප්‍රත්‍යය ශක්තිය තිබෙන්නේ ඕවාට විතරයි. අපි සිත් බෙදන කොට අපි බෙදාගන්නවා 'අහේතුක' 'සහේතුක' කියලා සිත් කොටසක්. එතකොට ඒ අහේතුක සිත්ටික අයින් උනාට පස්සේ අනිත් සිත් වල තිබෙන්නා වූ ප්‍රඥා චෛතසිකය විතක්ක චෛතසිකය වගේ ඒ නම දෙනාගේ තමයි ප්‍රත්‍යය ශක්ති ගුණය තිබෙන්නේ. ඒ කියන්නේ උපාය නැත්නම් පමුණුවන්නා වූ ගතිය, අරගෙනයන ගතිය තිබෙන්නේ ඔය ධර්ම වල විතරයි.

තව මේකේ පොඩි අපැහැදිලි තැන් තිබෙනවා. නමුත් පමුණුවන ගුණය ඕකේ ප්‍රකට වෙනවා. මේවායෙන් මොකකින් හරි යන්න පුළුවන්. ගියාට පස්සේ වෙනදේත් ඇත්ත වශයෙන්ම ඕකේ තිබෙනවා. නිවනට නම් ඇත්ත වශයෙන්ම ප්‍රඥා චෛතසිකය මුල්

වෙච්ච එකක් අවශ්‍යයමයි. ඊළඟට ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට සලකන කොට හේතු සහිතව තිබෙන්නා වූ සිත් 71 සහ ඒවායේ අවස්ථානුකූල ව යෙදී වැඩ කරන්නාවූ චෛතසික ටිකයි ඔක්කොම ප්‍රත්‍යය උප්පන්නයි. ඒ අර චෛතසික නම දෙනාගේ බලපෑම ලබන කට්ටිය.

ඊළඟට සහේතුක සිත් පහළ වෙනකොට ඒ සිත් එක්ක පහළ වෙනවා රූප ධර්ම. ඒවාට කියනවා **චිත්තජ රූප** කියලා. ආන්න ඒ ටිකත් අර මාර්ග ධර්මයන්ගේ බලය ලබන්නා වූ දේවල්. අනිත් එක තමයි ප්‍රතිසන්ධි අවස්ථාවේදී හට ගන්න **කර්මජ රූප**. මෙන්න මේවා මාර්ග ධර්ම වල තිබෙන්නාවූ බලය ඒවාගේම ප්‍රත්‍යය ශක්තිය විදින්න සිද්ධ වෙන සහ ඒවාට යටත් වෙන ධර්ම.

තවත් එකක් තිබෙනවා. කෙනෙකුට මෙතැනත් ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන්. දිගටම ධර්මය කථා කරපු නිසා අහේතුක සිත් සහේතුක සිත් කියලා කියනවා. ඒවා සම්බන්ධයෙන් කෙනෙකුට හැල හැප්පීම් තිබෙන්න පුළුවන්. සමහර කෙනෙකුට අවබෝධයක් තිබෙන්න පුළුවන්.

'මාර්ග ප්‍රත්‍යය ශක්තිය තිබෙන්නා වූ ධර්ම' සහ 'මාර්ග ප්‍රත්‍යය ශක්තියේ බලය ලබන්නා වූ ධර්ම' කියලා දෙකක් තිබෙනවා. ඒ ටික තමයි මම මේ විදියට කියලා දුන්නේ. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දුගතියට යන්න හෝ සුගතියට යන්න හෝ නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න යනවා කියන කොට අපිට නිතරම හිතෙන්නේ ජවන් සිත් වලින් තමයි මේ දේ සිද්ධ වෙන්නේ කියලා. නමුත් දැන් ස්වාමීන්වහන්සේ අපිට පැහැදිලි කරලා දුන්නා අව්‍යාකෘත ධර්ම හැටියට සෝභන ගණයට වැටෙන විපාක සිත් ටිකත් අයිති වෙනවා කියලා. ඒක නිසාම තමයි මේ සහේතුක ප්‍රතිසන්ධි රූප ප්‍රත්‍යය උප්පන්න වෙන්නේ කියලත් තේරෙනවා. ස්වාමීන්වහන්ස මග්ග පච්චයේදී ඒ වගේ විපාක ධර්ම වල බලපෑම කියන එක තව ටිකක් විස්තර කළොත් හොඳයි කියලා හිතුණා ඒ කියන්නේ ප්‍රතිසන්ධි ඇතිවෙන අවස්ථාවේදී ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - මෙහෙමයි තිබෙන්නේ. අවස්ථා දෙකක් තිබෙනවා මේක කථා කරන. එකක් තමයි සහජාතමය අවස්ථාව. අනිත් එක තමයි නා නා ක්ෂණික අවස්ථාව. සහජාත අවස්ථාවයි නා නා ක්ෂණික අවස්ථාවයි දෙකත් අපි තේරුම් ගන්න ඕනෑ. මේ මාර්ග ධර්ම කියන දේවල් හැටියට කථා කරපු ධර්ම සමුදායක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම හොඳටම මාර්ග වැඩේ කරන්න පුළුවන් ශක්තිය තිබෙන්නේ කුසල ඒවගේම අකුසල සහ මාර්ග සිත් හතරේ. ඒ සිත්වල තමයි තමයි පමුණුවන ගතිය හැබෑවටම හොඳටම ශක්ති සම්පන්නව තිබෙන ස්ථාන. නමුත් පමුණුවනවට වඩා ඒකෙ බලය ලබපු තැන් හැටියට සලකනකොට විපාක සිත් ටිකත් ඔක්කොම එක්කාසු වෙලා එනවා. විපාක සිත්වල ඇත්ත වශයෙන්ම **සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල විපාක** සිතක් තිබෙනවා. ඒ කුසල විපාක සිත කියන එක පහළ වෙනවා මනුස්ස ලෝකයේ. එතකොට ඒ විපාක සිත කියන එක ආවයින් පස්සේ ඒක ප්‍රතිසන්ධි සිතක්. ඒ ප්‍රතිසන්ධි සිත එක්කම

පහළ වෙනවා රූප සමුදායක්. ඒවා ප්‍රතිසන්ධි කර්මජ රූප. එතැනදී ඇතිවෙන්නේ නා නා ක්ෂණික වශයෙන් ඉස්සරවෙලා ඇතිවෙච්ච කුසල සිතක තිබෙන්නා වූ බලයක් තමයි මෙතැන විනිවිද මතුවෙලා එන්නේ. කුසල සිත්වල සහ චෛතසික වල තමයි මේවාට බලපෑම් කරන ශක්තිය හොඳටම තිබෙන්නේ. සහජාත වශයෙන් බැලුවාට පස්සේ සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත ඇතුලේ තිබෙනවා ප්‍රඥා චෛතසිකය. ඒක ඇත්ත වශයෙන්ම බොහොම ලාවට ගලාගෙන යනවා මිසක නා නා ක්ෂණික අවස්ථාවේදී පමුණුවන්නා වූ ගතිය හා සමාන එකක් ඒකෙ ඉදිරිපත් වෙනවා කියලා කියන්නේ නෑ. ඒක හිතන්නත් අපිට පුළුවන් නේ නෑ කියලා. නමුත් ප්‍රත්‍යය උප්පන්නධර්ම හැටියට කථා කරන කොටයි ඒක ඒ විදියට වෙන්නේ. සහේතුක සිත් 71 තිබෙනවා. ඒ සහේතුක සිත් 71 යෙදෙන චෛතසික ධර්ම සහජාත වශයෙනුත් නා නා ක්ෂණික වශයෙනුත් ඒවාට බලපෑම් තිබෙනවා ප්‍රත්‍යය උප්පන්න හැටියට. ඒ සහේතුක සිත් 71 තිබෙන්නා වූ ප්‍රත්‍යය ධර්ම හැටියට කථා කරන 9 දෙනා ඉන්නකොට සහජාත හැටියට මාර්ග බලයක් තිබෙනවා.

විපාක සිත කියන්නේ අව්‍යාකෘත ධර්මයක්. අව්‍යාකෘත ධර්මයේ සහජාත හැටියට තමයි ඒක ගණන් ගන්නේ. අපිට මේක තව ටිකක් තේරුම් ගන්න පුළුවන් වෙනවා ඉස්සරහදි කථා කරන විසර්ජනා වාර වලදී. ඒ විසර්ජනා වාරය කථා කරනකොට අව්‍යාකෘත ධර්මයන් හොඳට අපිට තේරුම් ගන්න පුළුවන් වෙයි. එතෙක් අපි ඉවසීමෙන් මෙය හසුරුවමු කියලා මෛත්‍රීයෙන් සිහිපත් කරනවා. මේ කියන ඒවා මේ පින්වතුන්ට තේරෙනවාද කියලා කියාගෙන යන කොට පොඩි සැකයකුත් ඇතිවෙනවා. යම් පිරිසකට නම් තේරුම් ගන්න පුළුවන් කියලා හැඟීමකුත් තිබෙනවා. ඇත්තටම මේ ප්‍රත්‍යය උප්පන්න කියන වචන අව්‍යාකෘත කියන වචනය නා නා ක්ෂණික කියන වචනය සහජාත කියන වචනය අපේ මේ අහගෙන ඉන්න පින්වතුන්ට තේරෙනවද?

<u>ජයන්ත මහත්මයා</u> - ස්වාමීන්වහන්ස මම හිතන්නේ තේරෙනවා කියලා යම් ප්‍රමාණයකින්. මොකද ස්වාමීන්වහන්සේ සම්බන්ධ නොවිච්ච අවස්ථාවලත් අපි විටින් විට පරණ ධර්ම කරුණු මතුකරලා සාකච්ඡා කරලා තිබෙනවා ස්වාමීන්වහන්ස. මම හිතනවා ස්වාමීන්වහන්ස කියන ඒවා තේරෙනවා කියලා. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මෙහෙම ප්‍රශ්නයක් හිතට ආවා ස්වාමීන්වහන්ස. ඔබ වහන්සේ කුසල පක්ෂයේ පළවෙනි සිත ගැන පැහැදිලි කළා. සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත සහ ඒකෙ තිබෙන චෛතසික පැහැදිලියි. එතකොට ස්වාමීන්වහන්ස විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන මාර්ග සිත කියලා අපි එක සිතක් ගත්තොත් ඒකත් මාර්ග සිතක්. කලින් කියපු එකත් මාර්ගයේ යන සිතක්. ඒ දෙක අතරේ ලොකු වෙනසක් තිබෙනවා කියලා තේරෙනවා. මහග්ගත සිත ලොකු තැනක තිබෙනවා කියලා තේරෙනවා. ඒ සිත් දෙක අතර තිබෙන වෙනස පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - දැන් ඇහුවේ ප්‍රථම ධ්‍යාන සිතේ තිබෙන්නා වූ චෛතසික ධර්ම මාර්ගයේ වැඩ කරන තාලේ. අපි බලන්න ඕන කොච්චර චෛතසික ධර්ම පළවෙනි ධ්‍යානයේ වැඩ කරනවද කියලා. ඒක කුසල් සිතක්. කුසල් සිතක අනිවාර්යෙන්ම වැඩ කරනවා කුසල චෛතසික 20 + සර්ව චිත්ත සාධාරණ චෛතසික 07 + මේ සිත ප්‍රථම ධ්‍යානය නිසා 'විතක්කය' තිබෙනවා 'විචාරය' තිබෙනවා ආරම්මණය නිසා 'අධිමොක්ඛය' තිබෙනවා කුසල විරිය වශයෙන් 'විරිය' චෛතසිකය වැඩ කරනවා. 'ඡන්දය' තිබෙනවා 'ප්‍රීතිය' තිබෙනවා. එතකොට චෛතසික 33 ක්ම තිබෙනවා. මේ සිතේ ආරම්මණික වශයෙන් වෙනස් කමක් තිබෙනවා. කාමාවචර කුසල් සිතෙත් ඔය චෛතසික ප්‍රමාණයම වැඩ කරනවා. ඔය ප්‍රමාණයම වැඩ කරනකොට ඒකෙ ආරම්මණය එක්තරා විදියකට තලන ස්වභාවයක් තිබෙන්න පුළුවන්. ඒක නිසා නීවරණයන්ට යාළුවෙන්න පුළුවන් හැකියාව ටිකක් ළඟ වැඩියි. අනිත් එක තමයි ධ්‍යානයකට ගියායින් පස්සේ නීවරණයන්ට එන්න පුළුවන් ගතිය ටිකක් දුරු කරලා ආරම්මණ වශයෙන් එක ආරම්මණයකට තියලා ඒ ආරම්මණයේ ඒකාග්‍රතාවය හොඳට ශක්තිමත් වෙලා තිබෙනවා. නමුත් ධර්ම වශයෙන් ගත්තම ඔක්කොම එක range එහකටයි යන්නේ. නීවරණයන් එක්ක ළඟ තිබෙන බවයි දුර තිබෙන බව තමයි ඕකේ තිබෙන්නාවූ වෙනස.

අපි හිතමු කාමාවචර සිතක් මුල් කරගෙන නිවනට පත් උනත් රූපාවචර ධර්ම මුල්කරගෙන නිවනට පත් උනත් ධ්‍යාන සිතකින් සංස්කාර ධර්මයන්ගේ තිබෙනන්නා වූ ලක්ෂණය නොබලා ඔය දෙකෙන් එකකින්වත් නිවනට යන්න බෑ. ඒ කියන්නේ කාමාවචර සිතක් ප්‍රයෝජනයට අරගෙන ඒ සිත නීවරණ ධර්මයන්ට ළඟ කථාව දුර කථාව කෙසේ හෝ වේවා ඒ හිතකිනුත් බලන්න ඕන වෙන්නේ සංස්කාර ධර්මයන්ගේ ලක්ෂණ. අනිත් හිතක් මුල් කරගෙන බැලුවත් ධ්‍යාන සිතක් පාවිච්චියට අරගෙන ධ්‍යාන සිතේ තිබෙන්නාවූ ශක්තිය මුල් කරගෙන නාම ධර්ම බැලුවත් සංස්කාර ධර්මයන්ගේ තිබෙන්නා වූ වෙනස අනිත්‍ය ලක්ෂණ දුක්ඛය බලන්නම වෙනවා. ඒවා නොපෙනී skip වෙන්නේ නෑ. ඔය නීවරණ ධර්මයන්ගේ ළඟ දුර බව හින්දා තමයි ඕකේ තිබෙන්නා වූ ශක්තිය තිබෙන්නේ, වෙනස් බව තිබෙන්නේ නැත්නම් අනිත් ඒවා ඔක්කොම සමානයි. ඒ හිත් දෙකේම මාර්ග අංග ටික තිබෙනවා. ධ්‍යාන වල ඒවා හයියට තිබෙනවා. අනිත් සිතෙත් තිබෙන්නා වූ ආරම්මණයේ හැටියට වැඩ කරනවා. ඔය ටික නේද ඇහුවේ?

<u>ප්‍රශ්නය නැවතත්</u> - එහෙමයි ස්වාමීන්වහන්ස ඒකත් ප්‍රයෝජන වෙනවා. සෝවාන් මාර්ග සිත දක්වාම ගිහිල්ලයි මම ඇහුවේ. සෝවාන් මාර්ග සිතේ ගොත්‍රභූ ඥානයෙන් පස්සේ පෘතක්ජන භූමියෙන් ඉවත්වෙන තැන ගැන මම ඇහුවේ. ප්‍රඥා චෛතසික දියුණු තැනක් නේද ස්වාමීන්වහන්ස?

<u>ස්වාමීන්වහන්සේ</u> - අනිවාර්යෙන්ම, අනිත් තැන් වල හිත් වශයෙන් කථා කරනවා මාර්ග අවස්ථාවේදී ප්‍රඥා චෛතසිකයට මුල් තැන දෙනවා. ප්‍රඥා චෛතසිකයේ වැඩේට අනිත් අය උදව් කරනවා.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස විතක්කය විශේෂයෙන්ම සම්පටිච්ඡන සිත් වලත් සන්තීරණ සිත් වලත් යෙදෙනවා. නමුත් තේරුම් ගත්තා ලෝභ දෝස මෝහ අලෝභ අදෝස අමෝහ යෙදෙන්නේ නැති නිසා මේ අහේතුක සිත් වල ඒ විතක්කයෙන් අර විදියට මාර්ගයක් හැටියට නරකයට හෝ සුගතියට හෝ නිර්වාණයට පත් කරන්න හැකියාවක් නැති හින්ද එතැන යෙදෙන විතක්ක චෛතසිකය සහිත සිත ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට නොගන්නවා කියලා. ඒවගේම ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අපිට දිට්ඨිය යෙදෙන ලෝභ මූල පළවෙනි සිත ගැන විස්තරයක් කළා. එතකොට කල්පනා උනේ මේ ද්වේශ සිත් යෙදෙන තැනදී දිට්ඨිය යෙදෙන්නේ නැති හින්දා එතැන යෙදෙන ව්‍යාපාද විතර්කය තමයි එතැනදී දුගති ගාමී මාර්ගයට ප්‍රත්‍යය වෙන්නේ කියලා. ඒ විදියට තේරුම් ගත්තොත් නිවැරදිද ස්වාමීන්වහන්ස. ඒවාගේම සන්තීරණ සම්පටිච්ඡන සිත් දෙක ගැනත් පොඩ්ඩක් විස්තර කරන්න ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - මහත්තයා අහපු ප්‍රශ්නය කවුරුහරි අහයි කියලා මම හිතුවා. මහත්තයා අහපු එක හොඳයි. ලෝභ මූල සිත්වල දෘෂ්ඨිය තිබෙන ඒවත් තිබෙනවා ඒවාගේම තමයි ලෝභය මුල් වෙච්ච ඒවා අනිවාර්යෙන්ම තිබෙනවා. අඩු බලයක් තිබෙන ඒවත් තිබෙනවා. ද්වේශ සහගත එකේ ගියාට පස්සේ ඇත්ත වශයෙන්ම ද්වේශය තමයි මහා බලවත් විදියට ඉදිරිපත් වෙලා තිබෙන්නේ. එතකොට මේ ද්වේශ සහගත සිතේ තිබෙන්නා වූ විතක්කය මිත්‍යා සංකල්පයේ වැඩේ කරනවා. ඊළඟට වායාමය මිත්‍යා වායාමය ලෙස වැඩ කරනවා. ඒකග්ගතාවය මිත්‍යා සමාධිය ලෙස වැඩ කරනවා.

යම් කිසි තැනකට පමුණුවන්න මේ අයට මේ ද්වේශයේ තිබෙන්නා වූ සප්ර්ශය වැදිච්ච හින්දා ඒවගේම මේ ගොල්ලෝ කරන්නේ එකතු කරන්නා වූ ශක්තිය අරගෙන ගිහිල්ලා තව තැනක රෝදය හැටියට කරකවන එකයි. උපාය වැඩේ මාර්ග වැඩේ තමයි මේ අයගේ තිබෙන්නේ. හැබැයි ඒක තේරුම් ගන්න පුළුවන් අපිට මෙහෙම. අපි කුසල පැත්තේ තැනකට ගියහම තේරුම් ගන්න පුළුවන් කුසල් කරනකොටත් තිබෙනවා සම්මා දිට්ඨිය නැතුව කරන පිංකම්. සම්මා දිට්ඨිය එනම් ප්‍රඥා චෛතසික සහජාත වශයෙන් යෙදෙන්නේ නැති උනාට විතර්කයටයි වායමයටයි විර්යටයි එකග්ගතාවයටයි අනිත් අයගේ තිබෙන්නා වූ තෙතමනය නිසා අනිත් අයගේ තිබෙන්නා වූ පෝර ගතිය වැදිච්ච නිසා මේ ගොල්ලන්ට මේක ගෙනියන්න පුළුවන්.

ද්වේශ සහගත සිතෙත් ඒවගේ තමයි. පොඩ්ඩක් එහෙමෙහෙ අඩු උනාට දෙන්නට ඇදගෙන යන්න පුළුවන් මේක ඉස්සරහට. ද්වේශ සහගත සිත් දෙකේ ලෝභය නැති උනා කියලා දෘෂ්ඨියේ අඩුපාඩුවක් තිබුණා කියලා ඒ ගොල්ලන්ට ඉතිරි හරිය කරන්න බැරි කමක් නෑ.

දැන් ඔය කුසල් සිතකින් අරගත්තොත් එහෙම මිනුස්සුන්ගේ ජීවිතිවල යම් යම් අඩුපාඩු ඇතුව ගෙනල්ලා දාල තිබෙනවා මනුස්ස ලෝකයට. සමහර කෙනෙකුට ඇහැ පෙන්නේ නැහැ. කන ඇහෙන්නේ නෑ. එතකොට මනුස්ස ලෝකයට එයාව පමුණුවලා තිබෙනවා. එයාට මනුස්ස ලෝකයට එන්න පාර හැදුවා. නමුත් ඒ අඩු වෙච්ච මාර්ග අංගය එනම්

ප්‍රඥා චෛතසිකයත් එකක් මිශ්‍ර උනේ නැති නිසා ඒකෙ අඩුවත් හරියට මෙතෙන්දි පෙන්නවා. 'මෙන්න මේ තත්වය අනුව තමයි එතැනදී මාර්ග අංග වැඩ කළේ, ඒකට අනුව තමයි මේ රෝදය කරකවාගෙන ඇවිල්ලා මේ මනුස්ස ලෝකයේ නවත්වලා තිබෙන්නේ' කියලා අර ප්‍රඥාව අඩු එකෙන් මෙතැනට ගෙනැල්ල දැම්මා. ඒවගේම තමයි ද්වේශය ස්පර්ශ වෙලා වායාමය ඇති උනහම ද්වේශය සපර්ශ වෙලා විතර්කය හැදුනහම ද්වේශය සප්රශ වෙලා ඒකාග්‍රතාවය ඇති උනහම ඒ ගොල්ලොන්ට ද්වේශයේ තිබෙන්නා වූ පින්තූරයත් එක්ක අරගෙන යන්න පුළුවන් ගතිය පමුණුවන්න පුළුවන් ගතිය ඒ තුන් දෙනාට තිබෙනවා. ඒක නිසා ඒක ඒ විදියටම තමයි අපි තේරුම් ගන්න ඕනැ. ඒක නිසා එක්කෙනක් දෙන්නෙක් අඩු උනා කියලා ඒ යන ගමන ඒ අයට බාධාවක් වෙන්නේ නෑ.

සමහර වෙලාවට මිනුස්සු වේගවත් වාහනයක් තිබුණහම වේගයෙන් යනවා. වේගවත් වාහනයක් නැතුව බයිසිකලෙන් පැදගෙන යනකොට ඒකට වේගයෙන් යන්න බෑ නමුත් තමන් pedal කරන වේගයට යන්න පුළුවන්. බයිසිකලයකුත් නැති උනාට පස්සේ එයාට පයින් උනත් යන්න පුළුවන් ඊටත් වඩා අඩු වේගයකින්. යෙදෙන්නා වූ මාර්ග අංග වල හැටි හැටියට තමයි ඒකෙ power එකයි speed එකයි force එකයි යෙදෙන්නේ.

සමපටිච්ඡන සන්තීරණ සිත් වල විතරක් නොවෙයි රහතන්වහන්සේලාගේ ක්‍රියා සිත් වලත් තිබෙනවානේ ඔය ධර්ම. එතකොට රහතන්වහන්සේලාගේ ක්‍රියා සිත් වල සම්ප්‍රයුක්ත ධර්ම හැටියට මාර්ග අංගයෝ තිබුණාට ඒවාට සුගතියකට හරි දුගතියකට හරි අරගෙන යන හැකියාවකුත් නෑ. ඒවා ක්‍රියා අව්‍යාකෘත. එතකොට මේ තිබෙන්නා වූ සම්පටිච්ඡන සන්තීරණත් විපාක සිත් නිසා ඒවාට අරවගේ ලොකු දෙයක් කරන්න පුළුවන් කමක් නෑ.

අව්‍යාකෘත ධර්මයන්ගේ සහජාත ධර්ම හැටියට තිබෙන්නා වූ දෙයක් තිබෙනවා. නමුත් ඒ සිත්වල ප්‍රධාන කට්ටිය නැති හින්දා සහේතුකව කථා කරන්න පුළුවන් ද්වේශය හරි ප්‍රඥාව හරි වැඩ කරන්නේ නැති නිසා ඒ සිත්වල මාර්ග අංග තිබුණත් එහෙම සලකන්නේ නෑ. ඒවායේ පැමිණිවීමේ ගතිය නෑ. හැබැයි 'හේතු' තිබෙන්නා වූ සිත්වල සහජාත ධර්ම හැටියට දෙයක් තිබුනොත් එහෙම ඒවා තමයි සලකන්නේ මහත්මයා.

ඉදිරියේදී අපි හිතාගෙන ඉන්නවා මේක ඉවර උනාට පස්සේ විසර්ජනාව කරමු කියලා. අපි ඉතින් වෙලාව කලාව ලැබෙන විදියට විසර්ජනාවත් බලමු. සත්ව නොවන්නා වූ පුද්ගල නොවන්නා වූ ධර්ම සමූහයක් පිළිබඳවයි අපි මේ කථා කරන්නේ. විසර්ජනා වාරයේදී ගොඩක් තිබෙන්නේ පේළි පිළිබඳව කියන එකයි. 'අව්‍යාකෘත ධර්ම පේළි' 'කුසල ධර්ම පේළි' 'අකුසල ධර්ම පේළි'. එතකොට අපේ පින්වතුන්ට දැනට වඩා ඉතාමත්ම හොඳ අවබෝධයක් ඇතිවේවි කියලා මම විශ්වාස කරනවා. මීට අවුරුද්දකට හරි දෙකෙකට හරි කලියෙන් මට මතකයි මහා බරපතල ධම්ම සංගණිය කියන පොතකුත් අරෙගන පට්ඨානය කරන්න ඕනෑ කියලා මගෙන් ඇහුවට පස්සේ මම කිව්වේ ඒක ලේසියෙන් කරන්න බෑ, ඒකට මූලික දැනුමක් තිබෙන්න ඕනෑ කියලා. ඊට පස්සේ අපේ මහත්තුරු ඇහුව මොකද ඒ කියලා. එතකොට අපි දැනගෙන ඉන්න ඕන තිකමාතිකාව,

අපි දැනගෙන තිබෙන්න ඕන මූලික ධර්ම කරුණු කියලා කිව්වට පස්සේ ඉක්මනට ධම්ම සංඝණීය අරගෙන සමහර පින්වතුන් කියවලා මට කිව්වා මෙලෝ දෙයක් තේරෙන්නේ නෑ කියලා. හැබැයි දැන් බලාගෙන යනකොට අපේ පින්වතුන්ට ඒවා මොනවාද කියලා යම්කිසි අවබෝධයක් හෙමිහිට හෙමිහිට හිත් වලට ගොනුකරගෙන තිබෙනවා. ඉතිං අද බයක් නැතුව සාමාන්‍ය දෙයක් කියන්න පුළුවන්. ඒ වැටහීම අපේ පින්වතුන්ට තිබෙනවා. සමහර විට අලුත් අයට මම කියන සමහර වචන තේරෙන්නේ නැති වත්දෝ කියලා හිතෙන නිසා තමයි මම අහන්නේ.

තවත් ඔය චෛතසික ධර්ම පිළිබඳව, සන්තීරණ වොත්තපන ධර්ම පිළිබඳව, ප්‍රතිසන්ධි කර්මජ රූප පිළිබඳව, චිත්තජ රූප වැඩ කරන හැටි, තිබෙන තැන් දන්නවා. ඒක ගැන හරි සතුටුයි. අනිත් එක තමයි මේකේ තිබෙන්නාවූ දේවල් තව හොඳට වටහා ගන්න පුළුවන් අපිට විසර්ජනා වාරය පිළිබඳව ඉගෙන ගන්න කොට. මේ කියපු දේවල්ම වෙන විදියකට කථා කරනවා. එතකොට තවත් හොඳට තේරේවි. ඒ අවස්ථාව ඉදිරියේදී උදා වේවා! කියලා අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

<u>ශ්‍රීමතී මහත්මිය</u> - තෙරුවන් සරණයි ගෞරවණීය ස්වාමීන්වහන්ස අද දිනයේත් භාග්‍යවත් වූ තථාගත වූ බුදුරාජාණන් වහන්සේ දේශනාකොට වදාළා වූ අති ගාම්භීර පට්ඨාන ප්‍රකරණයේ දේශනාවක් අප වෙනුවෙන් ඔබ වහන්සේ දේශනා කළා. ඒවාගේම අවසානයේ ඇසූ ප්‍රශ්න වලටත් අපිට උත්තර දීලා විසදලා දුන්නා. ස්වාමීන්වහන්ස අද දිනයේත් මේ සියලු කටයුතු වෙනුවෙන් සවනට සිසිලස කලණ මිතුරු මිතුරියන් වෙනුවෙන් ඔබ වහන්සේට ඉතාම කෘතවේදීව ගෞරවපූර්වකව පුණ්‍යානුමෝදනා කරනවා ස්වාමීන්වහන්ස. අපි විසින් රැස් කරගත්තාවූ සියලු කුසල් බලයෙනුත් ඔබ වහන්සේ සතු අපමණ කුසල් බලයෙනුත් ඔබ වහන්සේට මෙලොව වශයෙන් නිදුක් නිරෝගී සුවපත් දීර්ඝායුෂ ලැබේවා! ප්‍රාර්ථනා කරන්නා වූ උතුම් බෝධියකින් ඉතා සුවපහසුවෙන් මග ඵල නිවන් අවබෝධය කරා යා ගන්න හේතු වේවා! වසනා වේවා! නිවන් දක්නා මොහොත දක්වා උතුම් වූ කල්‍යාණමිත්‍ර සම්පත්තියම ලැබීමට මේ සියලු පිං හේතු වේවා! වාසනා වේවා! නිවන් දක්නා ජාති දක්වා නිදුක් නිරෝගී සුවපත් කායික මානසික ශක්තියෙන් යුක්ත වූ ශරීර ලැබිලා සුව පහසුවෙන් කටයුතු කරගන්න මේ පිං හේතුවේවා! වාසනා වේවා!

ඔබ වහන්සේගේ දෙමව්පිය නෑ දැ හිත මිතුරන්ටත් ගුරු උපාධ්‍යායන් වහන්සේලාටත් ඒ ආකාරයට නිදුක් නිරෝගීව සුව පහසුවෙන් නිවන් අවබෝධ කරගන්න ලැබේවා!

ඒවගේම අපිට මේ වගේ අවස්ථාවක් ලබලා දීලා අපිට ධර්මයේ විවිධ කොටස් විවිධ දිනවල සතියේ දවස් හත පුරාම ධර්මය ලබා දුන්නු අපගේ කල්‍යාණ මිත්‍ර ලලිත් දළුවත්ත මහත්මයාටත් සෑම සියලු දෙනා වෙනුවෙන් ඉතාම කෘතවේදීව පුණ්‍යානුමෝදනා කරනවා. ඔබ තුමාටත් මෙලොව වශයෙන් තිබෙන සියලු රෝග පීඩාවන්ගෙන් මිදිලා සුව පහසුවෙන් මාර්ග ඵල නිවන් අවබෝධය කරා යාගන්න ලැබේවා! දිර්ඝායුෂ ජීවිතියක් ලැබේවා! ඔබතුමාගේ මහත්මිය ඇතුළු දරුවන්ටත් පරලෝ සැපත් දෙමාපියන්ටත් ඒ ආකාරයටම මේ සියලු පිං බලයෙන් උතුම් වූ නිර්වාණ අවබෝධයට සුව පහසුවෙන් පැමිණෙත්වා!

අද දිනයේ ලෝකයේ විවිධ රට වලින් සවනට සිසිලස සම්බන්ධ වූ සියලුම කල්‍යාණ මිතුරු මිතුරියන්ටත් මතු මත්තේ මේ ධර්ම දේශනා අසන සියලුම පිං වතුන්ටත් ඉතාම ගෞරවයෙන් පුණ්‍යානුමෝදනා කරනවා. ඔබ සැම සියලුම දෙනාට නිදුක් නිරෝගී සුවපත් වූ ජීවිත ලබන්න මේ සියලු පිං බලය හේතු වේවා! වසනා වේවා! පතන්නා වූ උතුම් බෝධි වලින් මග ඵල නිවන් අවබෝධයට පත්වේවා! නිවන් දකිනා ජාති දක්වා උතුම් වූ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලබන සත්පුරුෂ ධර්ම ශ්‍රවණය කරන්න ලැබෙන පුණ්‍ය භූමිවල උපදින්නත් මේ සියලු පිං හේතු වේවා! වසනා වේවා! තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි සැමදෙනාටම තෙරුවන් සරණයි! යහපතක්ම වේවා! අදත් මේ පින්වතුන් සියලු දෙනාම තම තමන්ගේ සිත් මේ දෙකන් හරහා මේ ධර්ම මණ්ඩලයට යොමු කරගෙන රූප වශයෙන් හමු නොවුනත් ශබ්ද වශයෙන් හිත් වශයෙන් එක්කාසු වෙලා බුදුරාජාණන් වහන්සේගේ ධර්මය පිළිබඳව සිතුවා මෙනෙහි කළා. ඒ වාගේම නිතර නොකියෙවන තැන් හාරලා අවුස්සලා තමන්ගේ ඥානයට හසුකරගන්න පුළුවන් මට්ටමට ඒවා මතු කරමින් තේරුම් ගන්න උත්සාහ දැරුවා. මේ පට්ඨාන කථාවේ එක තැනක් තමයි අපි මේ කථා කළේ. අදත් මේ ධර්ම සාකච්ඡාව තුලින් මේ ඇසීම තුලින් මේ පින්වතුන් එක්රැස් කර ගත්තාවූ යම්කිසි හොඳ සිත්වල කුසල සිත්වල තිබෙන චේතනා බලයෙන් චේතනා ශක්තියෙන් සහ මේ ධර්මය දෙසූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ උතුම් ගුණානුභාව බලයෙනුත් මේ සැම දෙනාටම සැනසිල්ලක්ම යහපතක්ම වේවා! ධර්මය හොයන්නා වූ ධර්මය ගවේෂණය කරන ධම්මවිචය බෝධි අංගය සතිය ආදී අනෙකුත් අංගයත් වැඩේවා! ඒකට අනුයාත බෝධි අංග ධර්මත් වැඩේවා! කිසිම අවස්ථාවකදී කෙලෙසුන්ගෙන් පීඩනයට පත් වෙච්ච ගිලන් වූ සිත් ඇති නොවේවා! සැමදෙනාගේම සිත් ප්‍රභාෂ්වර වූ ධර්ම මනසිකාරයට ඉතාමත්ම ශක්ති සම්පන්න වූ ධර්මය ඉතා වේගවත්ව වැටහී යන්නාවූ නුවණකින් හෙබි හිත් බවට පත් වේවා! මේ ධර්ම මාර්ගයට උදව් උපකාර කරන්නාවූ පින්වත් දළුවත්ත මහත්මයාටත් නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! ඒ පවුලේ සැම දෙනාටම සැනසිල්ලක් වේවා!

මේ ධර්ම මණ්ඩපය මෙහෙයෙව්වා වූ ජයන්ත මහත්මයාටත් පිං අනුමෝදන් කළ ශ්‍රීමති මහත්මිය අනිත් අසාගෙන සිටි සැම දෙනාටමත් මේ උතුම් ධර්මයේ ආනුභාව බලයෙන් සුවසේ ගුණ පුරාගෙන මාර්ගය වඩාගෙන මේ මාර්ග ශක්ති ධර්ම දියුණු කරගෙන සම්මා දිට්ඨිය මුල් කරගෙන ක්‍රියාත්මක වෙන නිවන් අවබෝධ කරගන්න හේතුවෙන මාර්ගය වැඩී කෙළවර අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.